ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2019 දෙසැම්බර් මස 30 දින** |

## 2019 අංක 02 දරන මුදල් නීති පනතේ නියෝගයට අනුකූලව 2019 වසර අවසානය සඳහා වන බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතික ඉලක්ක සපුරා ගැනීම

“මෑතකාලීන ප්‍රතිපත්ති තීරණ, රුපියල් ණය සඳහා අදාළ වෙළඳපොළ ණය පොලී අනුපාතික වෙත කාර්යක්ෂමව සම්ප්‍රේෂණය වීම ඉහළ නැංවීම” යන 2019 අංක 02 දරන මුදල් නීති පනතේ නියෝගය අනුව සතිපතා ආර්ථික දර්ශක (Weekly Economic Indicators) ප්‍රකාශනයෙහි 2019 අප්‍රේල් මස 26 වෙනි දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවල සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතික (AWPR)[1] හා සැසඳීමේදී 2019 දෙසැම්බර් මස 27 වන දින වන විට සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතික අවම වශයෙන් පදනම් අංක 250 කින් පහළ දැමිය යුතුවේ. මෙම නියෝගය නිකුත් කළ දින හෝ ඉන් අනතුරුව සිය බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය වාර්ෂිකව සියයට 9.50 දක්වා හෝ ඊට වඩා අඩු කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා මෙම නියෝගය අදාළ නොවේ.

[1] සලකා බලනු ලබන සතියක් තුළ වාණිජ බැංකු විසින් සිය ප්‍රමුඛ ගණුදෙනුකරුවන් වෙත සපයන ලද කෙටිකාලීන ණය සහ අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතික මත පදනම්ව සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය ගණනය කරනු ලැබේ.

බලපත්‍රලාභී වාණිජ බැංකු රැසක් ඉහත නියෝගයට අනුකූලව කටයුතු කර ඇති අතර, ඇතැම් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නියාමන අවශ්‍යතාව සපුරාලීම සඳහා ඔවුන්ගේ බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය විශේෂයෙන් 2019 දෙසැම්බර් 20 දිනෙන් අවසන් වූ පෙර සතියේ සිට 2019 දෙසැම්බර් 27 දිනෙන් අවසන් වූ සතිය තුළදී විශාල ලෙස අඩු කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය සමස්තයක් ලෙස 2019 අප්‍රේල් 26 පැවති සියයට 12.24 සිට 2019 දෙසැම්බර් 27 දින වන විට සියයට 9.94 ක් දක්වා පදනම් අංක 230 කින් අඩු විය. මෙය 2016 අප්‍රේල් 29 දිනෙන් පසු බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය තනි අගයක මට්ටම දක්වා පහළ ගිය ප්‍රථම අවස්ථාව වේ.

අදාළ මුදල් නීති පනතේ නියෝගයට අනුව, කිසිදු බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සිය බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය දැනට අඩු කළ මට්ටමට වඩා ඉහළ නොදැමිය යුතු අතර, නියමිත ණය ප්‍රතිමිල කිරීමේදී අදාළ වෙළඳපොළ ණය පොලී අනුපාතික, විශේෂයෙන්ම බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය හා සම්බන්ධිත ණය පොලී අනුපාතික ඉදිරි කාලයේදී අඛණ්ඩව අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෙසේ වෙතත්, මහජන බැංකුව, කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී, ඉන්දියන් ඕවර්සීස් බෑන්ක්, එම්.සී.බී. බෑන්ක් ලිමිටඩ්, පබ්ලික් බෑන්ක් බර්හාඩ්, ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බෑන්ක්, අමානා බෑන්ක් පී.එල්.සී සහ ඇක්සිස් බෑන්ක් ලිමිටඩ්[2] යන බැංකු 2019 අංක 02 දරන මුදල් නීති පනතේ නියෝගය සමග අනුකූල වීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය කරන ලදී. මූල්‍ය පද්ධතිය හරහා මෑතකාලීන ප්‍රතිපත්ති තීරණ කාර්යක්ෂමව සම්ප්‍රේෂණය වීමෙන් පොදු මහජනතාවට අඛණ්ඩව ප්‍රතිලාභ හිමි කර දීම තහවුරු කිරීම සඳහා මෙම බැංකු සම්බන්ධයෙන් මෙන්ම අදාළ මුදල් නීති පනතේ නියෝගයේ සඳහන් අනෙකුත් විධාන සපුරා නොමැති බලපත්‍රලාභී බැංකු සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් කරයි.

[2] ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇක්සිස් බැන්ක් ලිමිටඩ් සහ අයි සී අයි සී අයි බැන්ක් ලිමිටඩ් හට ශ්‍රී ලංකාවේ සිදු කරන ව්‍යාපාර කටයුතු වසා දැමීමට, අදාළ බැංකුවල මව් සමාගම් විසින් සිදු කළ ඉල්ලීම් මුල් කරගෙන, කොන්දේසිවලට යටත්ව, අවසර ලබාදී ඇත. ඒ අනුව, මේ වන විට, මෙම බැංකුවලට මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීමද ඇතුලත්ව, බැංකු ව්‍යාපාරයේ නිරත වීම සඳහා අවසර නොමැත. මෙම බැංකු වෙත ලබාදී ඇති බලපත්‍ර, මෙරට ඔවුන්ගේ බැංකු ව්‍යාපාරය වසා දැමීමේ කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව අවලංගු කිරීමට නියමිතය.

| සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතික - බැංකු අනුව අනුපාතික | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **බැංකුව** | **26-04-19** (% වාර්ෂික) | **27-09-19** (% වාර්ෂික) | **01-11-19** (% වාර්ෂික) | **20-12-19** (% වාර්ෂික) | **27-12-19** (% වාර්ෂික) | **26-04-2019 සිට පදනම් අංකවල වෙනස්වීම** | **ළඟා කරගැනීමට නොහැකි වූ ප්‍රමාණය (පදනම් අංක)** |
| ලංකා බැංකුව | 12.88 | 11.56 | 10.97 | 10.39 | 10.24 | -264 | |
| මහජන බැංකුව | 12.49 | 10.60 | 10.36 | 10.50 | 10.15 | -234 | 16 |
| හැටන් නැෂනල් බැන්ක් පී එල් සී | 12.27 | 10.70 | 10.49 | 10.26 | 9.68 | -259 | |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී | 12.07 | 10.42 | 10.12 | 9.84 | 9.87 | -221 | 29 |
| සම්පත් බැන්ක් පී එල් සී | 12.95 | 11.07 | 10.51 | 11.43 | 10.44 | -251 | |
| සෙලාන් බැන්ක් පී එල් සී | 14.22 | 10.90 | 10.93 | 10.67 | 10.44 | -378 | |
| යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී | 16.68 | 12.00 | 11.45 | 10.82 | 10.72 | -596 | |
| පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී | 15.49 | 13.50 | 13.42 | 12.90 | 12.90 | -259 | |
| නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී එල් සී | 12.83 | 11.58 | 10.52 | 10.57 | 10.25 | -258 | |
| නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී | 12.45 | 11.33 | 10.75 | 10.18 | 9.89 | -256 | |
| ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී | 13.84 | 11.46 | 11.24 | 11.90 | 11.25 | -259 | |
| සිටි බැන්ක් එන් ඒ | 11.30 | 9.94 | 8.68 | 8.48 | 8.93 | -237 | |
| ඩොයිෂ් බැන්ක් ඒ ජී | 10.90 | 9.75 | 10.36 | 9.65 | 9.49 | -141 | |
| හබිබ් බැන්ක් ලිමිටඩ් | 12.73 | 12.73 | 10.57 | 10.42 | 10.21 | -252 | |
| ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් | 9.84 | 8.51 | 8.59 | 9.02 | 8.84 | -100 | |
| ඉන්දියන් බැන්ක් | 13.73 | 12.36 | 12.08 | 11.70 | 11.17 | -256 | |
| ඉන්දියන් ඕවර්සීස් බැන්ක් | 14.23 | 12.69 | 12.69 | 12.69 | 12.69 | -154 | 96 |
| අයි සී අයි සී අයි බැන්ක් ලිමිටඩ්[2] | 12.76 | 10.14 | 10.14 | 10.14 | 10.14 | -262 | |
| එම් සී බී බැන්ක් ලිමිටඩ් | 13.23 | 11.44 | 12.38 | 10.92 | 10.92 | -231 | 19 |
| පබ්ලික් බැන්ක් බර්හාඩ් | 13.25 | 13.25 | 13.37 | 12.50 | 12.38 | -87 | 163 |
| ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක් | 11.52 | 10.22 | 10.05 | 9.53 | 9.79 | -173 | 29 |
| ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා | 11.50 | 9.49 | 9.36 | 9.40 | 9.40 | -210 | |
| අමානා බැන්ක් පී එල් සී | 13.16 | 11.40 | 11.40 | 10.95 | 10.95 | -221 | 29 |
| ඇක්සිස් බැන්ක් ලිමිටඩ්[2] | 13.23 | 12.43 | 11.57 | 11.57 | 11.57 | -166 | 84 |
| කාගිල්ස් බැන්ක් ලිමිටඩ් | 16.28 | 14.68 | 12.87 | 14.57 | 12.42 | -386 | |
| බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ් | ණය ලබා දී නොමැත | | | | | | |


බැංකු අනුව සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකයේ අඩු වීම හා ළඟා කරගැනීමට
නොහැකි වූ පදනම් අංක ප්‍රමාණය
BOC
PB
HNB
ComBank
Sampath
Seylan
Union
PanAsia
NDB
NTB
DFCC
CitiBank*
Deutsche *
Habib
HSBC*
IndianBank
IOB
ICICI
MCB
PublicBank
SCB
SBI*
Amana
AxisBank
Cargills
Bank of China
පදනම් අංක
0
-50
-100
-150
-200
-250
-300
-350
-400
-450
-500
-550
-600
2019 අප්‍රේල් 26 සිට අඩු වීම
2019 දෙසැම්බර් 27 වන විට ළඟා කරගැනීමට නොහැකි වූ ප්‍රමාණය
* 9.50% ට වඩා අඩු වූ AWPR